(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක **33.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

---

**2024 ජූලි 02** අඟහරුවාදා පූ.භා. **9.30** ට

---

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා,** වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු කපිල අතුකෝරල මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු වීරසේන ගමගේ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණි ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**පාර්ලිමේන්තුවේ 16 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාර 2024 ජුනි 25 දිනැති කථානායකවරයාගේ නිවේදනය අනුව පාර්ලිමේන්තුව රැස්විය.**

**කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.** **රැස්වීම කැඳවීම සඳහා වන කථානායකවරයාගේ මතු පළවන නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් කියවන ලදී:—**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2390/07 - 2024 ජුනි මස 25 වැනි අඟහරුවාදා - 2024.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**කථානායකවරයාගේ නිවේදනය**

2024 ජූලි 02 වැනි අඟහරුවාදා පූර්ව භාග 9.30 ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 16 ස්ථාවර නියෝගය ප්‍රකාරව 2024 ජූලි 02 වැනි අඟහරුවාදා පූර්ව භාග 9.30 ට රැස්වන ලෙස පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක මහින්ද යාපා අබේවර්ධන වන මම මෙයින් දැනුම්දෙමි.

මහින්ද යාපා අබේවර්ධන,
කථානායක.

2024 ජුනි මස 25 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී ය.

EOG 06-0169

1A - G 42120 — 854 (2024/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/5/1

2024 ජුනි මස 22 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**3. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'ආර්ථික පරිවර්තන' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය සහ සාවධාන ලෙස සලකා බැලීමෙන් අනතුරුව පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල කිරීමට යෝජනා කරන ලද සංශෝධන පහත පරිදි වේ:—

1) පාර්ලිමේන්තුවේ අධීක්ෂණය පිළිබඳව 43 සහ 148 ව්‍යවස්ථාවන්ගෙන් ප්‍රමාණවත් පරිදි ආවරණය වන හෙයින්, පනත් කෙටුම්පතෙහි 8 වන වගන්තිය තුළ ඇතුළත් 4 ව්‍යවස්ථාවේ අන්තර්ගතය ඉවත් කිරීමෙන් සංශෝධනය කළ යුතු ය.

2) ස්වාධීන නියාමකයෙකු නිර්මාණය කිරීම සංශෝධන නීති පැනවීමක් මගින් ස්ථාපිත කළ හැකි බැවින් 13 (ආ) වන වගන්තිය ඉවත් කළ යුතු ය.

3) "ආර්ථික කොමිෂන් සභාව" නම් නෛතික අස්ථිත්වය එයට කොටස්, ව්‍යාපාර වස්තු, ණයකර සහ ඒ හා සමාන වත්කම් මිලදී ගැනීම, දැරීම සහ විකිණීමට හැකි වන පරිදි බලාත්මක කිරීම සඳහා 13 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

4) 15 වන වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල සහ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් හා ජනමත විචාරණයකින් පමණක් සම්මත කළ හැකි ය. එනමුත්, මෙම අධිකරණය විසින් සාකච්ඡා කරන ලද ආකාරයෙන් සහ ආකෘතියෙන් රජයේ ඉඩම් සන්තකය පැවරීම හෝ නියාදනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ඇති බලය පිළිගන්නා සංශෝධන සම්මත කරන්නේ නම්, විධිවිධානය සරල බහුතරයකින් සම්මත කළ හැකි ය.

5) පැහැදිලි කිරීමේ සහ විනිවිදභාවයේ කාර්ය සඳහා රෙගුලාසි හරහා ඊසී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සුදුසුකම්, පළපුරුද්ද සහ සේවා නියුක්තියේ නියමයන් සහ කොන්දේසි නියම කළ හැකි වන පරිදි 26 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

6) පැහැදිලි කිරීමේ කාර්ය සඳහා, එහි සන්දර්භය තුළ 'ආයෝජනය' යන යෙදුමේ වැදගත්කම ඉස්මතු කරමින් 'ආයෝජකයා' යන යෙදුම වෙනුවට 'ආයෝජනය' යන යෙදුම ප්‍රතියෝජනය කරමින් 45 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

7) (2) වන හෝ (4) වන උපවගන්ති යටතේ විමසීමකට හෝ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට නිශ්චිතව සඳහන් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ අසමත් වීම, එමඟින් සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් අවම කිරීම සඳහා, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා නිශ්චිත කාල රාමුවක් නියම කරමින් 46 (5) වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

8) ඉන්වෙස්ට් ශ්‍රී ලංකා මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා සමඟ විමසා කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම සඳහා 48 (2) වන වගන්තිය ප්‍රතිශෝධනය කළ යුතු ය.

9) 55 (2) (ආ) වන වගන්තියේ ඇතුළත් ඉවත් කරන ලද නීතිය පිළිබඳ සියලු සඳහන් කිරීම් ඉවත් වන පරිදි එකී වගන්තිය සංශෝධනය කළ යුතු ය.

10) එම වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක්ම නිකුත් කර මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව ඇතුළත් කරමින් 57 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

11) ආයෝජන කලාප පිහිටුවීමේ කාර්යය සඳහා සෝන්ස් එස්එල් වෙත දේපළ අත්කර ගැනීමේ බලය ලබා දෙනු ලබන 64 (ඇ) වන වගන්තිය ඉවත් කළ යුතු ය. මෙම සංශෝධනය මගින්, සෝන්ස් එස්එල් හි අධිකාරය ආයෝජන කලාප සඳහා අවශ්‍ය ඉඩම් පිළිබඳව ආර්ථික කොමිෂන් සභාවට නිර්දේශ කිරීමට සීමා වී ඇති බවත්, ඉඩම් අත්පත් කර ගැනීම දක්වා විහිදී නොමැති බවත් පෙන්වා දෙයි.

12) සෝන්ස් එස්එල් හි ප්‍රධාන විධායක නිලධරයා සඳහා වන සුදුසුකම්, පළපුරුද්ද සහ රැකියා කොන්දේසි සහ නියමයන් නියෝග මගින් නියම කළ යුතු බවට නියම කිරීමට 75 වන වගන්තිය ප්‍රතිශෝධනය කළ යුතු ය. ප්‍රධාන විධායක නිලධාරි වැනි ඉහළ තනතුරු සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්ද ඇති පුද්ගලයන් පත් කිරීම සහතික කිරීමත්, එමඟින් සුදුසුකම් නොලත් පුද්ගලයන් පත් කිරීම වැළැක්වීමත් මෙම විධිවිධානයේ අරමුණ වේ.

13) අනුමත කිරීමේ ක්‍රියාවලියේ ක්‍රියා පටිපාටියේ වැඩි දියුණු කරන ලද සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කරමින් නිශ්චිතව සඳහන් ආයතනවලට සිය ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම සඳහා ලිඛිතව කරුණු දැක්වීම සඳහා වූ කාලය දින පහළොවේ සිට දින විසිඑකක් දක්වා දීර්ඝ කිරීමට 90 (2) වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

14) යම් නිශ්චිතව සඳහන් ආයතනයක් විසින් පරීක්ෂණයක් හෝ ඉල්ලීමක් සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප, ප්‍රතිශෝධනය හෝ අපොහොසත් වන්නේ නම්, සෝන්ස් එස්එල් වහාම අමාත්‍යවරයාට දැනුම් දිය යුතු බව අවධාරණය කරමින් අලුත් උපවගන්තියක් ඇතුළත් කිරීමට පනත් කෙටුම්පතෙහි 90 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය. එතැන් සිට, දෙසතියක් ඇතුළත, අමාත්‍යවරයා විසින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතු ය. ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් කාලෝචිත විසඳුමක් ලබා දීම සහ වගවීම සහතික කිරීම මෙම සංශෝධනයේ අරමුණ වේ.

15) “1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ,” යන වචන ඉවත් කිරීම සඳහා 94 (2) (5) වන වගන්තිය සංශෝධනය කළ යුතු ය. මක්නිසා ද යත්, සේවානියුක්තිය සම්බන්ධ කිසිදු නියම සහ කොන්දේසි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ සඳහන් කර නොමැති බැවිනි.

16) එම වගන්තිය යටතේ නිකුත් කරන සෑම නියෝගයක්ම නිකුත් කර මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය බව ඇතුළත් කරමින් 96 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය. එම නියෝගය ක්‍රියාත්මකභාවයට පත්වන්නේ පාර්ලිමේන්තුවේ අනුමතය මත පමණි. පනත් කෙටුම්පත යටතේ සාදන ලද නියෝග අනුමතය සඳහා පාර්ලිමේන්තුවට යොමු කරනු ලබන පනත් කෙටුම්පතේ සෙසු වගන්ති සමඟ අනනුකූලවීම සහතික කිරීම සඳහා සංශෝධනය ඇතුළත් කළ යුතු ය.

17) ඵලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම්, පළපුරුද්ද සහ පත්වීමේ නියම හා කොන්දේසි නියෝග සෑදීම මගින් සිදු කළ යුතු බව ඇතුළත් කරමින් 147 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

18) ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම්, පළපුරුද්ද සහ නියම සහ කොන්දේසි නියෝග සෑදීම මගින් සිදු කළ යුතු බව සඳහන් කිරීමට 175 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

19) 192 (1) සහ (2) වන වගන්ති සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම කළ යුතු ය.

20) 55 වන වගන්තිය සඳහා යෝජනා කරන ලද සංශෝධනයට අනුකූල වන ලෙස, ඉවත් කරන ලද පනත පිළිබඳ සඳහන් කිරීම ඉවත් කරමින් 194 (2) (ක) වන වගන්තිය සංශෝධනය කළ යුතු ය. තව ද, යම් සේවානියුක්තිකයෙකු බීඕඅයි හි සේවයේ නියුක්තව සිටි කාලසීමාව ද ව්‍යවස්ථාපිත ගෙවීම් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු බව සඳහන් කරන ව්‍යතිරේකයක් එකතු කළ යුතු ය.

21) ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිශ්චිත කාල සීමා ඇතුළත් කිරීම සඳහා 194 (2) (ග) වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

22) අර්ථ නිරූපණ වගන්තිය, 'බීඕඅයි' හි කෙටි යෙදුම යෙදීම සහ 'අමාත්‍යවරයා' යන්නෙහි අර්ථ නිරූපණය සම්බන්ධව 195 වන වගන්තිය සංශෝධනය කළ යුතු ය.

23) 'වෙනත් යම් ලිඛිත නීතියක' යනුවෙන් සඳහන් වීම නිවැරදි කිරීම සඳහා 196 වන වගන්තිය සංශෝධනය කළ යුතු අතර, එය "මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය." යනුවෙන් කියවිය යුතු ය.

24) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත පිළිබඳ සඳහන ඉවත් කිරීමෙන් 55 (2) (ආ) (iv) වගන්තියේ ව්‍යතිරේකය, එවැනි සඳහනක් සැබෑ තත්ත්වය පිළිබිඹු නොකරන හෙයින්, සංශෝධනය කළ යුතු ය.

25) රීති සෑදීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා 55 (2) (ආ) (v) වගන්තිය ඉවත් කළ යුතු ය.

ඉහත කරුණු අනුව, මෙම අත්‍යවශ්‍ය සංශෝධන සිදු කරන්නේ නම්, පනත් කෙටුම්පත හා එහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට පත් වන බව ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් කරන අතර, ඒ අනුව, පනත් කෙටුම්පත සරල බහුතරයකින් සම්මත කළ හැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'රාජ්‍ය මූල්‍ය කළමනාකරණ' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

එකී තීන්දුව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය පනත් කෙටුම්පතේ ව්‍යවස්ථාපිතභාවය පහත පරිදි සාරාංශ කර ඇත:—

3(2)(ආ)(iv) වගන්තිය සහ "අධිකරණ සේවා සාමාජිකයන්" යන වචන සඳහා දී ඇති අර්ථ නිරූපණය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4(ඇ) ව්‍යවස්ථාවට, 12 (1) ව්‍යවස්ථාවට සහ 108 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් ඒවා අනුමත කළ යුතුය. එසේ වුවද, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත පරිදි 71 වගන්තියේ "අධිකරණ සේවා සාමාජිකයන්" යන වචන සඳහා දී ඇති අර්ථ නිරූපණය ඉවත් කිරීම සහ 3(2)(ආ) වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත නව උපවගන්තිය ඇතුළත් කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

5(2)(ඊ) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට, 43(1) ව්‍යවස්ථාවට සහ 52 (2) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් එය සම්මත කළ යුතු ය. එසේ වුවද, 5(2)(ඊ) වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ

සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

32(3) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාවට සහ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ දී විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතුය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

32(4) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාවට, 12(1) ව්‍යවස්ථාවට, 148 ව්‍යවස්ථාවට සහ 156(ඇ) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතුය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

34(2) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කළ යුතු ය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

38(3) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට සහ 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් එය සම්මත කළ යුතු ය.

39(1) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කළ යුතු ය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

63 වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4(ඇ) ව්‍යවස්ථාවට, 12(1) ව්‍යවස්ථාවට, 55(1) ව්‍යවස්ථාවට, 55(3) ව්‍යවස්ථාවට, 108 ව්‍යවස්ථාවට, 111ඟ (1)(ආ) ව්‍යවස්ථාවට, 153(ඇ) ව්‍යවස්ථාවට, 155උ(1) ව්‍යවස්ථාවට සහ 156ඊ ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ දී විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතුය. එසේ වුවද, 63(2) වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

68 වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ දී විශේෂ බහුතරයකින් සම්මත කළ යුතු ය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

69 වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව සහ 76 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 (අ) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ දී විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතු ය.

“රජයට අයත් ව්‍යවසාය” යන වචන සඳහා දී ඇති අර්ථ නිරූපනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට සහ 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් එය සම්මත කළ යුතු ය. එසේ වුවද, එම වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සාරාංශයේ යෝජිත සංශෝධනයන් සිදු කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.”

III

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව ම'විසින් 2024 ජුනි 27 දින 'ශ්‍රී ලංකා විදුලිබල' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

IV

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ' පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2024.07.01 දින ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

V

"ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා මියයාම හේතුකොට ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 ජුනි 30 දින සිට මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

එතුමාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කණගාටුවෙනි. මේ පිළිබඳව අප දැඩිසේ කණගාටු වන අතර මෙම ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව පාර්ලිමේන්තුව වෙනුවෙන් මම දන්වනු කැමැත්තෙමි.

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

තවද, අවසන් ගෞරව දැක්වීම සඳහා එතුමාගේ දේහය 2024 ජූලි 03, එනම් හෙට දින පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල උත්සව ශාලාවේ අපර භාග 2.00 සිට අපර භාග 4.00 වන තෙක් තැන්පත් කර තැබෙන බව ද තවදුරටත් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත කාරුණිකව දැනුම්දීමට කැමැත්තෙමි."

**4. ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජුනි 29 දිනැති අංක 2390/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා:** ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු රවුෆ් හකීම් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, යාපනය මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජී. ජී. පොන්නම්බලම් මහතාට 2024 ජූලි 02 දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම් වලට නොපැමිණීමට අවසර දිය යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව ඇමතීම:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(4) ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව අමතන ලදී.

**7. වෛද්‍ය (සංශෝධන):** සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 ජූලි 23 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8. වෛද්‍ය (සංශෝධන):** සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 ජූලි 23 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2024 ජූලි 09 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; පූ.භා. 11.06 ට කථානායකවරයා විසින් අද දින සභා සම්මුතිය අනුව 2024 ජූලි 09 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.